11-04-2026 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති මධුබන්2026/04/11

**සුමිහිරි දරුවනි, ඇතුලාන්තයට ගොස් ඥානයෙන් පිරිපුන් ස්ථිතියේ සිට, මෙම ශ්‍රේෂ්ඨ වදන් ධාරණය කරගන්න, එවිට ඔබට තමන්ට සහ අන් ජීවාත්මයන්ට යහපතක් කිරීමට හැකි වෙයි.**

**(දාදිවරුන්ගේ දිනපොත් වලින්).**

ඕම් ශාන්ති. සෑම සියලු උත්සාහ දරන දරුවෙක්ම ප්‍රථමයෙන් අනිවාර්යෙන් ඇතුලාන්තයට යොමු වීමේ ස්ථිතිය හදා ගත යුතුයි. ඇතුලාන්තයට යොමු වීමේ විශාල යහපතක් මුසු වී තිබේ. මෙම ස්ථිතිය තිබීමෙන් පමණයි ඔබට අචල, නිරන්තර, ඉවසිලිවන්ත සහ නිරහංකාරී වී, දිව්‍යමය ගුණදම් ධාරණය කර, සම්පූර්ණ ඥානයෙන් පිරිපුන් ස්ථිතියක් අත්කර ගැනීමට හැකි වන්නේ. ඔබ ඇතුලාන්තයට යොමු නොවන විට ඔබට පූර්ණ දැනුමින් පිරිපුන් ස්ථිතියක් අත්කර ගැනීමට හැකි වන්නේ නැහැ. මෙයට හේතුව වන්නේ, ඔබ පෞද්ගලිකවම සවන් දෙන ශ්‍රේෂ්ඨ වදන් ඔබ ධාරණය නොකරන්නේ නම් සහ ඔබ එහි ගැඹුරට නොයා, ඔබට ඇසෙන ශ්‍රේෂ්ඨ වදන් නිකම්ම නැවත කියන්නේ නම්, එවිට එම ශ්‍රේෂ්ඨ වදන්, වදන් පමණක්මයි. ශ්‍රේෂ්ඨ වදන් වලට, දැනුමින් පිරිපුන් ස්ථිතියකින් සවන් නොදෙන්නේ නම්, එවිට මායාගේ සෙවණැල්ල එම ශ්‍රේෂ්ඨ වදන් මතට වැටෙයි. ඔබට ඇසෙන ශ්‍රේෂ්ඨ වදන් ඔබ නිකම්ම නැවත පවසන විට, ඒවා මායාගේ අපවිත්‍ර චිත්ත තරංග වල බලපෑමට හසු වෙයි, එවිට ඔබ සහ අන් අයට ඒවාගෙන් යහපතක් සිදුවනවා වෙනුවට, පාඩුවක් අත්විඳියි, එබැවින්, 'අහෝ දරුවනේ, සම්පූර්ණයෙන් ඇතුලාන්තයට යොමු වන්න!' ඔබගේ මනස දෙවොලක් වැනිය. දොවොලක සෑම විටම සුගන්ධයක් තිබෙන සේම, ඔබගේ මනසේ දෙවොල පිවිතුරු වන විට පමණයි, පිවිතුරු සිතිවිලි මතු වන්නේ. දොවොලක තබන්නේ රකුසන්ගේ පිංතූර නොවෙයි, පිවිතුරු දේවතාවන්ගේ ප්‍රතිමා පමණයි. ඒ ආකාරයෙන්ම, ඔය සෑම දරුවෙක්ම ඔබගේ මනසේ සහ හදවතේ දෙවොල සියලුම දිව්‍යමය ගුණධර්ම වල ප්‍රතිමා වලින් සැරසිය යුතුයි. එම ගුණධර්ම වන්නේ, බැඳීම් වලින් නිදහස්ව සිටීම, තන්හාවෙන් නිදහස් වීම, බියෙන් නිදහස්ව සිටීම, ඉවසිලිවන්ත සහ නිරහංකාරී වීමයි, මන්ද, ඔබගේ දිව්‍යමය ගතිගුණ මේවාය. ඔය දරුවන්, ඔබගේ මනසේ දෙවොල ඉතා දීප්තිමත් සහ පැහැදිලි බවට පත්කළ යුතුයි, එනම්, සම්පූර්ණයෙන්ම පිවිතුරු බවට. ඔබගේ එම දෙවොල එතරම් දීප්තිමත් සහ පැහැදිලි වන විට පමණයි ඔබට ඔබගේ බොහෝ සේ ආදරණීය, දීප්තිමත් සහ පැහැදිලි පාරාදීසියට යාමට හැකි වන්නේ. ඔබ දැන් ඔබගේ මනස සම්පූර්ණයෙන් දීප්තිමත් කිරීමට තැත් කරන අතර, පාපයන්ගේ බලපෑම යටතේ ඇති ඔබගේ මනස සහ භෞතික ඉන්ද්‍රියන් පාලනය කිරීමට උත්සාහ දරමින් සිටිනවා. ඔබ සේවය කළ යුත්තේ, තමන්ට පමණක් නොවෙයි, ඔබ අන් අය වෙනුවෙන්ද මෙම දිව්‍යමය සේවාව කළ යුතුයි. ඇත්ත වශයෙන් සේවය කිරීමේ අරුත, ඉතා සියුම් මෙන්ම ගැඹුරුයි. සේවය කිරීම යනු කෙනෙකුට වැරැද්දක් ගැන අනතුරු ඇඟවීම පමණක් නොවෙයි නැහැ. ඔබ ඔබගේ යෝගා බලයෙන්, සූක්ෂම චිත්ත තරංග ඔවුන් වෙත යවා ඔවුන්ගේ අපවිත්‍ර සිතිවිලි පුළුස්සා දැමිය යුතුයි. මෙය ඉතා ශ්‍රේෂ්ඨ සැබෑ සේවයයි. ඒ සමගම ඔබ තමන් වෙතටද අවධානය යොමු කළ යුතුයි. ඔබගේ වචන සහ ක්‍රියා වෙත පමණක් නොවෙයි ඔබගේ මනසේ වුවද අපවිත්‍ර සිතිවිලි නොතිබිය යුතුයි මන්ද, ඒවායේ චිත්ත තරංග තව බොහෝ දෙනෙක් වෙතට ලඟා වී සියුම් ලෙස හානියක් සිදු කරයි, එවිට එය ඔබට බරක් ඇති කරයි මෙම බර ඉන්පුසව බන්ධනයක් වෙයි. එබැවින් දරුවනේ, ප්‍රවේසම් වන්න, එමෙන්ම අන් අය වෙනුවෙන් මෙම දිව්‍යමය සේවයත් සිදු කරන්න. ඔය සේවයට ලැදි දරුවන්ගේ අලෞකික වගකීම මෙයයි. එවන් සේවය සිදුකරන අය, වෙනත් අයගෙන් කිසිදු සේවයක් ලබා නොගත යුතුයි. ඔබ අතින් වැරැද්දක් සිදුවුණත් ඔබගේ බුද්ධියේ යෝගාවේ බලයෙන්, එය සෑම කලටම අවසන් කරන්න. තීව්‍ර උත්සාහ දරන්නෙකුට කුඩා සංඥාවක් ලැබුණු විටම ඔහු සැනින් අවබෝධ කරගෙන, තමන්ව පරිවර්ථනය කරමින් එතැන් සිට ඉදිරියට යන අතර නිසි අවධානයක් යොමු කරයි. පුළුල් බුද්ධි ඇති දරුවන්ගේ යුතුකම මෙයයි. අහෝ මගේ ජීවිතයේ ප්‍රාණය, ඔබගේ සිරුරු, මනස සහ ධනය, පරමාත්ම ජීවය විසින් නිර්මාණය කරන ලද මෙම ස්ව-ආධිපත්‍යයේ අවිනාශී ඥානයේ යාග හෝමයට සම්පූර්ණයෙන් කැප කිරීමේ ගැඹුරු වැදගත්කමක් තිබේ. ඔබගේ සිරුර, මනස සහ ධනය ඔබ කැප කළ බව පැවසූ මොහොතේ සිට, එනම්, ඔබ සෑම දෙයක්ම යාග ගින්නට බිලි කර මියැදී ඇති බවයි, එවිට එම මොහොතේ සිට කිසි දෙයක් ඔබගේ නොවෙයි. එයින්ද ඔබ ප්‍රථමයෙන් ඔබගේ සිරුර සහ මනස සේවය වෙනුවෙන් සම්පූර්ණයෙන් භාවිත කළ යුතුයි. සෑම දෙයක්ම යාගය සහ පරමාත්ම දෙවියන් වෙනුවෙන් නම්, තමන් වෙනුවෙන් කිසි දෙයක්

ඉතිරිව තිබිය නොහැක, එබැවින් ඔබට කිසිදු ධනයක් පවා අපතේ හැරිය නොහැක. ඔබ එය පරමාත්ම දෙවියන්ට කැප කර ඇති නිසා ඔබගේ මනසට වුවද, අපවිත්‍ර සහ පාපකාරී සිතිවිලි පසුපස හඹා යා නොහැක. පරමාත්ම දෙවියන් කොහොමත් පාරිශුද්ධත්වයේ සහ සාමයේ ජීවයයි. මේ නිසා අපවිත්‍ර සිතිවිලි ඉබේටම නිහඬ වෙයි. ඔබ තම මනස, මායාගේ අතේ තබන්නේ නම්, එවිට, මායාට විවිධ ස්වරූප තිබෙන නිසා, බොහෝ අන්දමේ පාපකාරී සිතිවිලි පැන නැඟ, අශ්වයා වන මනස පිට ගමන් කළ හැක. යම් දරුවෙකුට දැන් පවා තවමත් පාපකාරී සිතිවිලි තිබෙන්නේ නම්, ඔහුගේ මනස සම්පූර්ණයෙන් කැප කර නොමැති බව වටහාගන්න, එනම්, ඔහුගේ මනස සම්පූර්ණයෙන් පරමාත්ම දෙවියන්ට අයත් නැත. එබැවින් සම්පූර්ණයෙන් අත්හල දරුවනේ, දැන් ගැඹුරු රහස් වටහාගෙන, ක්‍රියා සිදුකරන අතර නොබැඳි නරඹන්නන් වී, තමන්ව නිරීක්ෂණය කර, ඉතා ප්‍රවේසමින් ගමන් කරන්න. ගෝපි වල්ලභම, ඔහුගේ ආදරණීය ගොපළු ගොපළියන්ට, ඔබ සියලු දෙනාගේ සත්‍ය සෙනෙහස කුමක්ද කියා ඔබට පහදා දෙනවා. අහෝ මගේ ආදරණීයයන්, ඔබ එකිනෙකාගේ ආදරණීය අනතුරු ඇඟවීම පිළිගත යුතුයි මන්ද, මලක් කෙතරම් සුන්දර වන්නේද, ඔබට ලැබෙන පෝෂණය ඒ අනුව ශ්‍රේෂ්ඨ වෙයි. මල් වල වටිනාකම වැඩි කිරීම සඳහා උයන්පල්ලා ඒවාගෙන් කටු ඉවත් කළ යුතුයි. ඒ අන්දමින්ම කෙනෙක් ඔබට අනතුරු අඟවන විට, ඒ කෙනා ඔබව පෝෂණය කරන බව ඔබ වටහාගත යුතුයි, එනම්, ඒ කෙනා ඔබට සේවය කරන බව. ඔබ එම සේවයට සහ පෝෂණයට ගරු කළ යුතුයි. අංග සම්පූර්ණ වන අන්දම මෙයයි. මෙය ඥානයෙන් පිරි සත්‍ය අභ්‍යන්තර සෙනෙහසයි. මෙම දිව්‍යමය සෙනෙහස තුළ එකිනෙකා කෙරෙහි විශාල ගෞරවයක් තිබිය යුතුයි. සෑම අවස්ථාවකදීම ඔබ පළමුව තමන්ට අනතුරු ඇඟවිය යුතුයි. මෙය ඉතාම මිහිරි සහ නිහතමානී ස්ප්‍රීතියකි. මේ ආකාරයට සෙනෙහසින් ගමන් කරන විට, ඔබ ඇතුලතින් ස්වර්ණමය යුගයේ ඒ ලස්සන දවස් අත්විඳින්නාක් මෙනි. එහිදී, මෙම සෙනෙහස ස්වභාවික වෙයි. කෙසේවෙතත්, සංගම යුගයේ මේ මිහිරි කාල වකවානුවේදී, මෙය, ඔබට එකිනෙකාට සේවය කිරීමට මඟපාදන, ඉතාම මිහිරි සහ විනෝදාත්මක සෙනෙහසකි. මෙම පිවිතුරු සෙනෙහස, ලෝකයේ සිහි කර තිබේ. ඔය සියලුම ජීවමාන මල් සෑම මොහොතකදීම ප්‍රබෝධමත්ව සිටිය යුතුයි, මන්ද, ඔබගේ බුද්ධියේ විශ්වාසය තිබීමෙන්, ඔබගේ සෑම නහරයක්ම පරමාත්ම දෙවියන්ගේ බලයෙන් සම්පූර්ණයෙන් පිරෙයි. එතරම් ආකර්ෂණයක් ඇති බලය, අනිවාර්යෙන් එහි දිව්‍යමය හාස්කම පෙන්වයි. කුඩා අහිංසක දරුවන්, පිවිතුරු සහ පිරිසිදු නිසා, සෑම විටම සිනහ මුසුව සිටින අතර ඔවුන් සියලු දෙනාව ඔවුන්ගේ විනෝදාත්මක ක්‍රියාකාරකම් වලින් බොහෝ සේ ආකර්ෂණය කරන ආකාරයට. ඒ අන්දමින්ම ඔය සෑම කෙනෙකුගේම ජීවිතය, දේවමය සහ විනෝදාත්මක එකක් විය යුතුයි. මේ සඳහා, නිවැරදි ක්‍රමවේදය භාවිත කිරීමෙන් ඔබගේ රකුසු ගති ස්වභාවය ඔබ පරාජය කළ යුතුයි. කෝපයේ දුර්ගුණය ඇති කෙනෙක් ඔබ වෙතට පැමිණෙන බව ඔබ දුටු විට, දැනුමේ ප්‍රතිමූර්තියක් වී, දරුවෙකුගේ මිහිරියාවෙන් නොකඩවා මඳ සිනහවක් පාන්න, එවිට එම පුද්ගලයා ඉබේටම නිහඬ වෙයි. එනම්, අමතකවීමේ අවදියක සිට ඔහුට සිහිය ඇති වෙයි. ඔහුගේ අවධානයට එය නොපැමිණුනත්, සියුම් අන්දමකින් එම කෙනා මත ජයගෙන, අධිපති වන්න. මෙය අධිපතියෙක් සහ දරුවෙක් වීමේ වඩාත්ම ශ්‍රේෂ්ඨ අන්දමයි. පරමාත්ම දෙවියන්, ඥානයේ පරිපූර්ණ ස්වරූපය වන සේම, ඔහු සෙනෙහසේද පරිපූර්ණ ස්වරූපයයි. මෙම ගුණාංග දෙකම පරමාත්ම දෙවියන් තුළ මුසුව තිබෙන නමුත් ප්‍රථමයෙන් දැනුම වන අතර දෙවනුව තිබෙන්නේ සෙනෙහසයි. කෙනෙක් ප්‍රථමයෙන් දැනුමේ ප්‍රතිමූර්තියක් නොවී සෙනෙහසේ ප්‍රතිමූර්තියක් වන්නේ නම්, එම සෙනෙහස, එම කෙනාව අපවිත්‍ර ගිණුමක් තුළට ගෙන යයි. එබැවින් සෙනෙහස මුසුකර ප්‍රථමයෙන් ඥාන මිණි මුතුවල ප්‍රතිමූර්තියක් වන්න. විවිධ ස්වරූප වලින් පැමිණෙන මායාව පරාජය කරන්න, ඉන්පසුව සෙනෙහසේ ප්‍රතිමූර්තියක් වන්න. ඔබ දැනුම භාවිත නොකර සෙනෙහසින් යුක්ත වන්නේ නම්, ඔබ අතුරු මාවතකට නැඹුරු වීම, සිදුවිය හැකි දෙයකි. නිදසුනක් ලෙස, කෙනෙක් ඥානයේ ප්‍රතිමූර්තියක් නොවී, ධ්‍යානයකට සම වදී නම් (trance) එවිට ඔවුන් ඇතැම් විට මායා තුළ සිර වෙයි. මේ නිසයි බාබා මෙසේ පවසන්නේ අහෝ දරුවනේ, මෙම ධ්‍යානයට සම වැදීමත් කපු දම්වැලකි. කෙසේවෙතත්, ඔබ ප්‍රථමයෙන් දැනුමේ ප්‍රතිමූර්තියක් වී ඉන්පසුව ධ්‍යානයකට සම වදින්නේ නම්, බොහෝ සේ විනෝදයක් ලැබිය හැක. එබැවින් පළමුව ඥානය සහ දෙවනුව ධ්‍යාන ගත වීමය. ඥාන මිණිමුතු වලින් පිරිපුන් වීමේ ස්ප්‍රීතිය, ධ්‍යානගත වීමේ ස්ප්‍රීතියට වඩා ශ්‍රේෂ්ඨයි. මේ නිසයි දරුවනේ, ඔබ පළමුව දැනුමේ ප්‍රතිමූර්ති බවට පත් විය යුත්තේ, ඉන්පසුව සෙනෙහස ඉස්මතු කරගන්න. මෙම උත්සාහ දරණ ජීවිතයේ දැනුම නොමැතිව සෙනෙහස තිබීම, බාධක ගෙන එයි. නොබැඳි නරඹන්නෙකුගේ ස්ප්‍රීතිය, බොහෝ විනෝදාත්මකයි, මිහිරියි, ලස්සනයි. ඔබගේ අනාගත ජීවිතවල සෑම දෙයක්ම රඳා පවතින්නේ මෙම ස්ප්‍රීතිය මතයි. කෙනෙකුට යම් භෞතික රෝගයක් තිබෙන විට, ඔහු සතුටින් නොබැඳි නරඹන්නෙකුගේ ස්ප්‍රීතියේ හිඳිමින් ඒ වෙලාවේ එම රෝගය පසු කර යන්නේ නම්, එවිට ඔහු අතීත කර්මයේ විඳීම පියවන අතර ඒ

සමහම අනාගතය වෙනුවෙන්ද ඔහුගේ ගිණුමේ සතුටින් රැස් කරගනී. නොබැඳි නරඹන්නෙකුගේ මෙම ප්‍රීතිමත් ස්ථිතියට, ඔබගේ අතීතය මෙන්ම අනාගතය සමහඳ සම්බන්ධකමක් තිබේ. මෙම රහස වටහා ගැනීමෙන්, මෙම සුන්දර කාලය, ගිණුම් පියවීමෙන් පමණක් ගෙවී ගිය බව, ඔබගෙන් කිසිවෙක් නොකියනු ඇත. නැහැ, උත්සාහ දැරීමේ සුන්දර කාලය මෙය පමණක්ම වන අතර කාර්යයන් දෙකම අංගසම්පූර්ණව නිමා කරන්නේ එහිදිය. කාර්යයන් දෙකම නිම කරන තීව්‍ර උත්සාහ දරන්නන්, අතීන්ද්‍රීය සුඛය සහ ආනන්දය අත්විඳියි. ඔය දරුවන් තුළ මෙම විශාල විවිධත්ව නාටකයේ සෑම කරුණක් ගැනම පූර්ණ විශ්වාසයක් තිබිය යුතුයි, මන්ද, මෙම පෙර නියමිත වූ නාටකය, පූර්ණ විශ්වාසය තැබිය හැකි එකකි. බලන්න, මෙම නාටකය, සෑම ජීවමාන ජීවයකටම (මනුෂ්‍ය සහ සත්ත්ව) තම චරිත කොටස පරිපූර්ණ අන්දමකින් රඟපෑමට මඟපාදයි. කෙනෙක් වැරදි වුණත්, ඔහු එම වැරදි කිරීමේ චරිත කොටස සම්පූර්ණයෙන් නිවැරදිව රඟපායි. මෙයත් නාටකයේ නියම වී තිබේ. සැලසුම තුළ, වැරැද්ද සහ නිවැරදි දේ යන දෙකම නියමිත වී තිබෙන විට, එවිට යමක් ගැන සැක ඇති වීම, දැනුම නොවෙයි, මන්ද, සෑම නළුවෙක්ම රඟපාන්නේ ඔහුගේ චරිත කොටසයි. චිත්‍රපටයක, සියලුම විවිධ නළුවන් තම තමන්ගේ රඟපෑම් සිදු කරන අතර, ඔබ ඔවුන්ව දකින විට, ඔබ සමහරුන්ට අකමැති වන අතර තවත් අය සමඟ සතුටු වන්නේ නැහැ එය එසේ නොවෙයි. මෙය, සෑම කෙනෙකුටම ඔහුගේ හෝ ඇගේ හොඳ හෝ නරක චරිත කොටස ලැබී ඇති, නාටකයක් පමණක් බව ඔබ දන්නවා. ඒ ආකාරයෙන්ම, ඔබ නොකඩවා මෙම සදාතනිකව නිර්මාණය වී ඇති චිත්‍රපටිය නැරඹිය යුත්තේ, නොබැඳි නරඹන්නෙක් විලසින්, ස්ථාවර සහ ප්‍රබෝධමත් ස්ථිතියකින්. ඕනෑම සමූහයක් තුළදී මේ සියලුම කරුණු ඉතා හොඳින් ධාරණය කරගන්න. එකිනෙකාගේ දිව්‍යමය ස්වරූපය දකිමින් එකිනෙකා දෙස බලන්න. අත්දැකීම් වල දැනුමින්, සියලුම දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න. ඔබගේ අරමුණ ගැන අවධානයෙන්, සාමකාමී, නිහතමානී, ඉවසිලිවන්ත, මිහිරි සහ නිවුණු බව ආදි දිව්‍යමය ගුණධර්ම ඉස්මතු කරගන්න. සාමකාමී ස්ථිතියක් ධාරණය කරගැනීමේ ප්‍රධාන අත්තිවාරම වන්නේ 'ඉඳලා බලන්න.' අහෝ මගේ ආදරණීය දරුවනේ, 'ඉඳලා' යනු ඉවසීම ඇති කරගැනීමයි, 'බලන්න' යනු, බැලීමය. ප්‍රථමයෙන් ඔබගේ හදවත් වල ඉවසීමේ ගුණධර්මය ධාරණය කරගන්න, ඉන්පසුව නොබැඳි නරඹන්නෙක් ලෙසින් බාහිරින් ඇති විශාල නාටකය නරඹන්න. ඔබට යම් රහස් වලට සවන් දීමට ඇති කාලය සමීපයට පැමිණෙන තුරු ඔබට ඉවසිලිවන්ත වීමේ ගුණධර්මය තිබිය යුතුයි. කාලය පැමිණි විට, ඔබ ඉවසීමේ ගුණදහමින් එම රහසට සවන් දෙන විට, එය ඇසීමෙන් ඔබ කලබල නොවෙයි. මේ නිසයි, අහෝ උත්සාහ දරණ අය, ටිකක් ඉන්න, එමෙන්ම ඔබ ගමන් කරන අතර නොකඩවා රහස් දකින්න. මෙම ඉවසීමේ ස්ථිතියෙන් ඔබගේ සියලුම කාර්යයන් අංග සම්පූර්ණව නිම වෙයි. මෙම ගුණධර්මය විශ්වාසය සමඟ සම්බන්ධයි. විශ්වාසය ඇති ඔබගේ බුද්ධියෙන් නොබැඳි නරඹන්නන් වී, ඔබගේ ප්‍රබෝධමත් මුහුණු වලින් සෑම ක්‍රීඩාවක් දෙසම බලන්න, එවිට ඔබ ඇතුලාන්තයෙන් ඉවසිලිවන්ත සහ නොසැලී සිටියි. අවසානයේ, පරිසමාප්ත කාලයේ, ප්‍රායෝගිකව ඔබට ඇති වන, දැනුමේ පරිණත ස්ථිතිය මෙයයි. එබැවින් ඔබ දිගු කාලයක් පුරා මෙම නොබැඳි නරඹන්නෙකුගේ ස්ථිතියේ ස්ථාවරව රැඳී සිටීමට මහත් උත්සාහයක් දැරිය යුතුයි. නාට්‍යයක, සෑම නළුවෙක්ම ඔහුට ලැබී ඇති චරිත කොටස හොඳින් රඟපෑම සඳහා පෙර පුහුණු විය යුතුයි. ඒ අන්දමින්ම, ඔය ආදරණීය මල්, පැමිණීමට යන අපහසු විභාගයෙන් සමත් වීම සඳහා, ඔබ අනිවාර්යෙන් යෝගා බලය තුළින් පෙර පුහුණු විය යුතුයි. කෙසේවෙතත්, ඔබ දීර්ඝ කාලයක් පුරා මෙම උත්සාහය දරා නැත්නම්, එවිට ඔබ බිය වී එම වෙලාවේ අසමත් වෙයි. මේ නිසයි ඔබ ප්‍රථමයෙන් ඔබගේ දිව්‍යමය අත්තිවාරම ස්ථිර කර, දිව්‍යමය ගුණධර්ම ඇති අය බවට පත් විය යුත්තේ. ඥානයේ ප්‍රතිමූර්තියක් විමේ ස්ථිතියේ ස්ථාවරව සිටීමෙන්, ඔබට ඉබේටම ශාන්තියේ ප්‍රතිමූර්තියක් විමේ ස්ථිතිය ඇති වෙයි. දැනුමින් පිරිපුන් දරුවන් මුරලියට සවන් දීමට එකට අසුන්ගත් විට, ඔවුන් වටේටම සාමයේ වාතාවරණයක් නිර්මාණය වෙයි, මන්ද, ඔවුන් ශ්‍රේෂ්ඨ වදන් වලට සවන් දෙන විට, මේවා ඔවුන්ගේ ඇතුලාන්තයේ ගැඹුරටම පසාරු වෙයි. ඒවායේ ගැඹුර තුළට යාම නිසා, ඔවුන් ගැඹුරු, මිහිරි නිහැඬියාව අත්විඳියි. මේ සඳහා ඔබ අසුන්ගෙන විශේෂ උත්සාහයක් දැරීමට අවශ්‍ය වන්නේ නැහැ, නමුත් ඥානයේ ස්ථිතියක ස්ථාවරව රැඳී සිටීමෙන් ඔබ මෙම ගුණධර්මය ඉබේටම වර්ධනය කරගනී. ඔය දරුවන් හිමිදිරි උදයෙන් අවදි වී හුදකලාව අසුන් ගත් විට, පිවිතුරු සිතිවිලි රළ මතු වෙයි. ඒ වෙලාවේ ඔබගේ මනෝ ස්ථිතිය සම්පූර්ණයෙන් එපිට සිටීමේ එකක් විය යුතුයි. එවිට ඔබගේ ආදිතම පිවිතුරු සිතිවිලි වල ස්ථාවර වීමෙන්, අනෙක් සියලුම සිතිවිලි ඉබේටම යටපත් වී ඔබගේ මනස ශාන්ත වෙයි. ඔබගේ මනස පාලනය කරගැනීමට හැකි වීම සඳහා ඔබට අනිවාර්යෙන්ම යම් බලයක් අවශ්‍යයි. මේ සඳහා ඔබගේ අරමුණ වෙනුවෙන් පිවිතුරු සිතිවිලි ධාරණය කරගන්න. ඔබගේ විනයට අනුව ඔබගේ බුද්ධිය යෝගාවේ සිටින විට, ඔබට ඉබේටම අනෙක් සියලු සිතිවිලි වලින් නිදහස්ව සිටීමේ ස්ථිතිය ඇති වෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට, ඥාන මිණි මුතු වල උද්‍යානය වන දරුවන්ට, ඥානයේ තාරකාවන්ට, ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

**1.**

ඔබගේ අරමුණ ගැන අවධානයෙන්, ශාන්තිය, නිහතමානිකම, ඉවසිලිවන්ත බව, මිහිරියාව සහ නිවුණු බව යන සියලු ගුණධර්ම ධාරණය කරගන්න.

**2.**

ඔබගේ බුද්ධියේ විශ්වාසයෙන්, ප්‍රබෝධමත් මුහුණකින්, නොබැඳි නරඹන්නෙක් විලසින් මෙම නාටකය නරඹා, ඇතුලතින් ඉවසීමෙන් සහ නොසැලී සිටින්න. නොබැඳි නිරීක්ෂකයෙකුගේ ස්ථිතියේ ස්ථාවරව රැඳී සිටීම සඳහා ඔබ දීර්ඝ කාලයක් පුරා වෙහෙසිය යුතුයි.

**වරදානය:** ඔබ ඒකායන මාවත අනුගමනය කර, සියළු සම්බන්දතා ඒකායන කෙනා සමග පවත්වා, අංගසම්පූර්ණ සුරදූතයෙක් වේවා.
ඔබගේ බුද්ධිය, ඒකායන පියාගේ අශාරීරික සහ ශාරීරික ස්වරූප වල ඇසුරේ සහ සබැඳියාවක තබා ගන්න, එවිට ඔබ සුරදූතයෙක් වෙයි. ඒකායන කෙනා සමග සියළු නෑකම් සහ සියළු සබඳතා පවත්වන අය සෑම විටම සුරදූතයන්ය. රජය විසින්, මාර්ගයේ මෙවන් පුවරුවක් දමයි: මේ පාර වසා ඇත, ඒ අන්දමින්ම ඔබගේ බුද්ධියේ සැරිසැරීම නතර වන අන්දමට සියළු මාවත් අවහිර කරන්න. බාප්දාදාගේ නියෝගය වන්නේ: ප්‍රථමයෙන් සියළු මාවත් වසා දමන්න, එමෙන්ම මෙසේ කිරීමෙන්, ඔබ පහසුවෙන් සුරදූතයෙක් වෙයි.

**පාඨය:** මායාගෙන් ආරක්ෂිතව සිටීමේ ක්‍රමය වන්නේ, සේවය වෙනුවෙන් නිරන්තරයෙන් උනන්දුව සහ උද්යෝගය තිබීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරිබව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

ඔබගේ ස්වරූපය ඔබගේ වචන වලට සමාන විය යුතුයි. ඔබගේ වදන් පැහැදිලි මෙන්ම සෙනෙහස, නිරහංකාරකම සහ මිහිරිබවින් පූරවන්න. ඒවා සත්‍යයෙන් පිරී තිබිය යුතුයි, නමුත් ඔබගේ ස්වරූපයේ නිරහංකාරකමත් තිබිය යුතුයි. මෙම ස්වරූපය තුලින් ඔබට පරම පියාව හෙළිදරව් කිරීමට හැකි වෙයි. නොබියව රැදෙන්න, නමුත් ඔබගේ වදන්, විනය රීති මාලාවට අනුව විය යුතුයි. මේ දෙකෙහිම තුලනයක් තිබෙන විට විශ්මයන් දිස් වෙයි. එවිට ඔබගේ වදන් අමිහිරි නොව, මිහිරි බව ඔවුන්ට දැනෙයි.